සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සිංහල - II

**12 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය ද, දෙවන කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයේ සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.**
- **පළමු කොටස හා දෙවන කොටස පිළිතුරු පත් සමඟ අමුණා භාරදෙන්න.**

---

### I කොටස

---

- **එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැලපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

(01) (1.1) **අල්පප්‍රාණ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.**

(1) ඝ, ඛ, ඪ, ධ, හ (2) ග, ඵ, හ, ඨ, බ (3) ව, ච, ස, ල, හ

(4) ක, ච, ට, ත, ප (5) ග, ජ, ඪ, ද, හ (.....)

(1.2) පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) 'ය' අක්ෂරයේ අර්ධය යන අරුතින් 'යංශය' යන්න භාවිත නොවේ.

(2) 'යංශය' යෙදෙන විට පෙර අක්ෂරයේ 'හල් ලකුණ' ඉවත් නොවේ.

(3) ඕනෑම හල් අකුරකට පසුව යෙදෙන ස්වරාන්ත 'ය' කාරය වෙනුවට යංශය යෙදේ.

(4) 'ර්' කාරය හඟවන රේඵය යංශයට උඩින් යෙදීම පැරණි නිවැරදි භාවිතය වේ.

(5) හල් 'ර්' කාරයට පසුව යෙදෙන 'ය' ද්විත්ව නොවේ. (.....)

(1.3) **අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.**

(1) කැකිරාව, කැලණිය, කොට්ටාව, කඩුවෙල

(2) ආටිගල, ඇඹුල්දෙණිය, ඉංගිරිය, අනුරාධපුර

(3) මාතර, මිරිස්ස, මිහින්තලේ, මොනරාගල

(4) ලිහිණියාගම, ලාහුගල, ලබුතලේ, ලේල්වල

(5) යාපහුව, යටියන්තොට, යාපනය, යුදගනාව (.....)

(1.4) **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත** පද පේළිය තෝරන්න.

(1) පරිඝණකය, දෘශ්‍යකාව්‍යය, කලමණාකරණය, ආභාෂය

(2) පරිගණකය, දෘෂ්‍යකාව්‍යය, කළමනාකරණය, ආභාශය

(3) පරිඝනකය, දෘශ්‍යකාව්‍යය, කලමනාකරනය, ආභාසය

(4) පරිගනකය, දෘෂ්‍යකාව්‍යය, කළමනාකරණය, ආභාෂය

(5) පරිගණකය, දෘශ්‍යකාව්‍යය, කළමනාකරණය, ආභාසය (.....)

(1.5) **රේඵය, රකාරාංශය, ගැටය, සහිත ඇලපිල්ල, ගයනු කිත්ත සහිත වචන අනුපිළිවෙලින් යෙදී ඇති** වරණය තෝරන්න.

(1) සම්පූර්ණය, වනෞෂධ, කෘෂි, ග්‍රහයා

(2) කෞමුද, නිර්මල, ගෘහ, යන්ත්‍ර

(3) වර්ගය, භ්‍රමණය, වෘෂභ, ලෞකික

(4) වර්ණය, ශ්‍රවණ, නෞකා, තෘණ

(5) කෘමි, බ්‍රහ්ම, වර්තමාන, සෞඛ්‍යය (.....)

(1.6) එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.

(1) සදහම්චාරිත්‍ර, සොඳුරුසන්ධ්‍යාව, සිරිපාලාංජනය, මිනිස්ශරීරය

(2) අෂ්ටාංගශීලය, පූර්ණඝටය, උද්‍යානභූමිය, දුට්ඨගාමිණී

(3) පරිත්‍රාණදෙසුම, මැදුම්පිළිවෙත, විසිතුරුදසුන, අටසිල්

(4) දළදාමැඳුර, විමසුම්ඇස, ඉඳුනිල්මිණ, රන්ආභරණ

(5) ශක්‍ර දිව්‍යරාජ, සූර්යමඬල, චන්ද්‍රබිම්බ, බුදුරශ්මි (.....)

(1.7) **තත්සම වචන පමණක්** අන්තර්ගත වරණය කුමක්ද?

(1) තණ, කන, වණ, දන

(2) ආභරණ, මැණික්, රුක්, කර්ෂාපණ

(3) අරුත්, වර්ෂා, ස්ත්‍රී, ධර්ම

(4) චන්දන, වන්දන, නන්දන, ගිමන

(5) ශිලා, ලෝහිත, උෂ්ණ, ධරණී (.....)

(1.8) මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත්** පද පේළිය තෝරන්න.

(1) සමාන අසදෘශ, විෂම, අකුලස, අසම

(2) නිසැක කුකුස්, කුහුල්, විසිතිස්, සංකා

(3) නැගෙනහිර පැළදිග, බස්නාහිර, ප්‍රතිචීන, ඉඳුරුදිග

(4) දොම්නස අමොද, තිසුම්, නඳන්, තුස්

(5) මිතුරු අමිතුරු, පරිවි, පිළිමල්, විරිඳු (.....)

(1.9) මුලින් දැක්වෙන පදයට **සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත්** පද පේළිය තෝරන්න.

(1) රන් කනක, කසුන්, කාංචන, හේම

(2) රශ්මි රස්, කැන්, කැලුම්, දෝ

(3) වඳුරු ගොනගුල්, වානර, සාමුව, ශාඛාමෘග

(4) අහස ගුවන, අඹර, ගගන, නුබ

(5) පියුම් අම්බුජ, ඉඳුවර, පොකුර, පද්ම (.....)

(1.10) **විභක්ති, දකාරාර්ථ, අව්‍යය, අන්‍යාර්ථ** යන සමාසවලට අයත් පද **පිළිවෙලින්** දක්වා **ඇති** වරණය තෝරන්න.

(1) නෙතුපුල්, වනමල්, අසුර, ඉරහඳ

(2) රන්කම්, ගස්වැල්, සියපත, යාවජීව

(3) ගංවෙරළ, කටුවැල්බටු, පබල, තිනෙත්

(4) නරරකුසු, ලුනුදෙහි, අනර්ථ, සුන්බත්

(5) ළමාපෙරහැර, ඇත් අස්, දැමිදුරු, නිදොස් (.....)

(1.11) **කෘදන්ත පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.

(1) කියුම්, කෙරුම්, බැලුම්, නැටුම්

(2) ඉදිකිරීම්, සීරීම්, වැටීම්, ලිවීම්

(3) ගයනා, රචනා, දුවනා, පනිනා

(4) වදාළ, කළ, දළ, පහළ

(5) බැලූ, වැයූ, කියූ, වැසූ (.....)

(1.12) **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් **ක්‍රියාවර්ගය පිළිවෙලින්** දක්වා ඇති වරණය තෝරන්න.

(අ) **එව කව** බොව කියන ඉසුරින් පිරුණු හැමදින

(ආ) වනවිල් වැද බොල් සෙවෙලැග **තවරා**

(ඉ) මලගෙටියෙන් පැන් පොවමින් අතින'තින

(ඊ) පුන්සඳ කිරණ **එත** නුබ ගඟ වතුරු ලෙස

(උ) රිසිපල රැස විඳ සතොසින් **දවසරුව**

(1) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

(3) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) විධි ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා

(5) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා (.....)

(1.13) පහත සඳහන් පද ආරෝහණ ක්‍රමයට සකසන්න.

(1) සොළොස, තුදුස, තෙළෙස, සතළොස

(2) තෙළෙස, තුදුස, සොළොස, සතළොස

(3) තෙළෙස, සොළොස, සතළොස, තුදුස

(4) තෙළෙස, සතළොස, තුදුස, සොළොස

(5) තුදුස, සොළොස, සතළොස, තෙළෙස, (.....)

(1.14) ''තෙවළා **රුවන්කර** උඩු යටි කර රුවට / එහසුන් මතු කියමි ඔබ ගිය **සඳ** සබඳ''

ඉහත පද්‍ය පාද දෙකෙහි තද කළු අකුරෙන් මුද්‍රිත පද දෙක අයත් වියරණ වර්ගය පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සන්ධි හා කාලාර්ථ නිපාත

(2) තද්ධිත හා බහු අර්ථ පාද (බහ්වර්ථ පද)

(3) තද්ධිත හා කාලාර්ථ නිපාත

(4) කෘදන්ත හා කාලාර්ථ නිපාත

(5) සන්ධි හා බහු අර්ථ පාද (බහ්වර්ථ පද) (.....)

(1.15) ''**දානාදී සුචරිතයෙහි** යෙදී **සතරසංග්‍රහවස්තුවෙන්** ජනරඤ්ජනය කොට විසූහ යි **භාග්‍යවත්** බුදුරජාණන් වහන්සේ කොසොල් රජ හට වදාරා.......'' යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති** පද අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, උපසර්ග, සන්ධි හා තද්ධිත

(2) සන්ධි, උපසර්ග, සමාස හා තද්ධිත

(3) සන්ධි, උපසර්ග, තද්ධිත හා සමාස

(4) තද්ධිත, උපසර්ග, සන්ධි හා සමාස

(5) තද්ධිත, සමාස, සන්ධි හා උපසර්ග (.....)

(1.16) ව්‍යාකරණානුකූලව **නොගැළපෙන** පදයක් ඇති වරණය තෝරන්න.

(1) ගයව, යනු මැන, කියග, අස

(2) අනේ, අහෝ, චිකේ, අපොයි

(3) මුදුනත, මුහුණත, අවනත, යවනත

(4) ගෞරවනීය, පූජනීය, දර්ශනීය, වන්දනීය

(5) වටොර, දැත, මොහොර, දැගසච් (.....)

(1.17) **සමාස නොවන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

(1) රන්දම්, මුතුපට, රිදීබඳුන්, ගල්පඩි

(2) ඇත්අස් සිනහව, රන් රුවන්, ගහකොළ, ඉරහඳ

(3) පැරකුම් රජු, රහුල්තෙර, මිහිඳු හිමි, සේනක පඬි

(4) දසරාජධර්ම, තෙරුවන්, ෂඩ්වර්ණ, සත්කුළු පව්ව

(5) සිලිලාර, අනුනාහිමි, උපනගර, සඳය (.....)

(1.18) **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) සුරත, දකුණත, දසත, අතිනත

(2) පුනරුත්, දෙයාකාර, උරෙනුර, කටුවල

(3) පොල්ලත්ත, රුක්කත්තන, වල්ලම්බලම, අල්ලස්

(4) ලිග්ගල, ගොක්කොළ, සිත්තම්, පෙස්සම

(5) මුංකිරිබත්, අංකටුස්සා, දංගස, නියංසාය (.....)

(1.19) ව්‍යාකරණානුකූලව **නිවැරදි වාක්‍යය** තෝරන්න.

(1) අප බොරු කියතැ'යි ගුරුවරු සිතති.

(2) ඕ තොමෝ සිංහල දූරියක නොවූවා ය.

(3) සොරුන් නිතරම එහි එනවා ලූ.

(4) අප ගුණවන්තයෝ වන්නෙමු.

(5) මිනිස්සු ගස් කපද්දී පිරිස රැස්වූහ. (.....)

(1.20) වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

(1) පැරකුම් මහරජ පොළොන්නරුව අග්‍රරාජධානිය කර ගත් හ.

(2) ඇය යාමට සැරසෙත් ම ඇය පිළිබඳ ව මගේ අදහස නිවැරදි බව මම සිතුවෙමි.

(3) ස්වාමියා බෙහෙවින් ම ප්‍රිය කළේ බිරිඳගේ සූපශාස්ත්‍රඥානය යි.

(4) භාෂා සංවර්ධනයෙහි ලා භාෂාප්‍රේමීත්වය මහ මෙහෙයක් ඉටු කරයි.

(5) ප්‍රශස්ත සාහිත්‍ය ග්‍රන්ථ, සේවනය කිරීම මිනිසාගේ බුද්ධියවර්ධනය කරයි. (.....)

(ලකුණු 20)

---

## II කොටස

---

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තුමූ භූසුරයනැ'යි කියා ගත් බමුණන්ගේ පාලනයට යටත් වූ ඉන්දියානු රාජ්‍යයන්හි පහත් යැයි සම්මත කුලවල ජනයා ගත කළ ජීවිතය ඉතා කටුක එකක් විය. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ දෙපිරිස හැරුණු විට, ඉතිරි ජනතාව බමුණන් විසින් රවටන ලද රජුන් විසින් දක්කනු ලබන ගවරැළකට නො දෙවැනි විය. මෙසේ ඉන්දීය සමාජය මුළුමනින් වළලා ගෙන පැවති කුලභේදයට පළමු කොට ම පහර දෙන ලද්දේ බුදු රජාණන් වහන්සේ විසිනි. ජාතියෙන් කිසිවකු උසස් පහත් නො වන බව දේශනා කරමින් සියල්ලන්ගේ මානුෂික නිදහස හා අයිතිවාසිකම් සමාන බව පැහැදිලි කළ උන්වහන්සේ ඉතා ම පහත් යයි සම්මත වූ කුලවල මිනිසුන් පවා තම ශාසනයට ඇතුළත් කර ගෙන කුලීනයන් ලවා වැන්දවූහ. බමුණන්ගේ පාරම්පරික මිථ්‍යා ගර්වයට පහර දෙමින් උන් වහන්සේ කළ සටනින් පහත් යයි ගැනුණ කුලවල මිනිසුන්ට තම මනුෂ්‍යත්වයේ වටිනාකම අවබෝධ වීම ඉන්දීය ජන සමාජයේ නවාලෝකයට කරුණු විය. සමාජයෙහි වූ සෑම වහල් බන්ධනයක් ම කඩා බිඳ දමමින් එකල පැවති සමාජ තත්ත්වය උඩුයටි කර පෙරළීමෙන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද මහා විප්ලවය ලෝක ඉතිහාසයෙන් කිසි කලෙක නොමැකෙන්නකි.

(1) කුලභේදය, ඉන්දියානු ජන සමාජය කෙරෙහි බල පැවැත්වූයේ කෙසේ ද?

(2) කුලභේදය ගැන බුදුහු කුමක් දේශනා කළෝ ද?

(3) ඉන්දීය ජන සමාජයේ අභිනව ආලෝකයට හේතු වූයේ කුමක් ද?

(4) නීච කුල ජනයා මහණකිරීමෙන් කුලභේදයට වූයේ කුමක් ද?

(5) බුදුන් වහන්සේ කළ මහා විප්ලවය කුමක් ද? (ලකුණු 2×5 = 10)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වන සේ සාරාංශ කොට ලියා වචන සංඛ්‍යාව ද එහි අග සඳහන් කරන්න.

සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ තුනක් ඇත. මේවා නම් සන්නිවේදකයා, පණිවුඩය හා ග්‍රාහකයා ය. සන්නිවේදකයා හෙවත් පණිවුඩය දීමේ අභිලාෂය ඇති පුද්ගලයා වෑයම් කරන්නේ තමාට හැකි පමණින් පැහැදිලි ලෙස යම් සංකේත සමූහයක් ගොඩනැඟීමයි. අතින් හෝ හිසින් කවර සංඥාවක්, ශරීරාංගයකින් කරන ඉඟියක්, කටින් නිදපවන හඬක් හෝ වචනයක්, පෑනෙන්, මුද්‍රණ යන්ත්‍රයෙන් ලියැවෙන අකුරක් හෝ වචනයක් යන මේ ආදී කවරෙහිත් යම් අදහසක්, පණිවුඩයක් අන්තර්ගත නිසා ඊට සංකේත යන පදය යොදා ගත හැකි ය. මෙබඳු සංකේත භාවිතා කරන සන්නිවේදකයාගේ අපේක්ෂාව වන්නේ ග්‍රාහකයා තුළ ඒ මගින් ප්‍රතිචාරයක් ඇති කිරීමයි. මෙම ප්‍රතිචාරය වාචික හෝ අවාචික විය හැකි ය. ඇසට කනට ස්පර්ශයට ගෝචර විය හැකි ය. මේ සන්නිවේදන ක්‍රියාවලිය හා සම්බන්ධ මූලික පිරිවරයි. කිසියම් ග්‍රාහකයෙක් තමා වෙත යොමු කරන ලද සංකේත ඇසුරෙන් කිසියම් පිළිවෙළකින් යුත් පණිවිඩයක්, අර්ථයක් නිර්මාණය කරයි. මෙය වූ කලී සන්නිවේදන ක්‍රියාවලිය හා සම්බන්ධ දෙවන පියවරයි. සන්නිවේදකයන්, ග්‍රාහකයන් එකිනෙකා සමඟ සම්බන්ධයක් ඇති කර ගන්නේ පණිවුඩය මඟිනි. කිසියම් පණිවුඩයක් මඟින් ඒකාබද්ධ කරනු ලබන ක්‍රියාදාමය සන්නිවේදනය වශයෙන් හැඳින්වීම යෝග්‍ය ය. එබැවින් පණිවුඩය, සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණයයි. මෙසේ ප්‍රධාන වශයෙන් සන්නිවේදකයා, පණිවුඩය, ග්‍රාහකයා යනුවෙන් තෙවැදෑරුම් ලක්ෂණවලට සීමා කර දැක්වෙතත් සන්නිවේදන කාර්යය බෙහෙවින් සංකීර්ණ ය.

(ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාරණානුකූලව ලියන්න.

(1) රටක සංවර්ධනය කෙරෙහි දැඩි බලපෑම් එල්ල කරන කෘෂි ආර්ථිකයේ අවශ්‍යතාව.

(2) සමාජ වෙබ් අඩවි මගින් එකමුතු වන හා ගිලිහී යන මානව සබඳතා.

(3) මාර්ග අනතුරු අවම කර ගැනීම උදෙසා වන කඩිනම් වැඩපිළිවෙළක අවශ්‍යතාව.

(4) ක්‍රමයෙන් අභාවයට පත් වන සාම්ප්‍රදායික ජන ක්‍රීඩා.

(5) බුද්ධිමත් ප්‍රේක්ෂක සමාජයක් බිහිකිරීමේ ලා රූපවාහිනියේ කාර්ය භාරය. (ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල <u>සදොස් තැන් ඇතොත් නිදොස් කොට</u> ලියන්න.

(1) දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙක් වන්නේ කෙසේ ද?

(2) සරසවියෙහි උගතුන් ඇත.

(3) සියලු රෝග පීඩා දුරු වී නාහිමියෝ සුවපත් වේවා !

(4) බුත්සරණ කර්තෘ හෙවත් විද්‍යාචක්‍රවර්තීන් නව මඟක් අනුගමනය කළහ.

(5) නුඹ හෝ මම හෝ ආරම්භක දේශනය කරන්නෙමි. (ලකුණු 05)

(ආ) පහත සඳහන් **වාක්‍ය කර්මකාරකයට** හරවන්න.

(1) මැණියෝ පන්සලේ දී සංඝයා වහන්සේ වැන්දහ.

(2) මුරකරුවෝ සොරුන් පලවා හරිති.

(3) ක්‍රීඩා නායකයෝ තරග බිමේදී තොප ඇමතුහ.

(4) විදුහල්පතිතුමා අප පසසයි.

(5) හෙතෙම පිහියකින් අඹ කැපුවේ ය. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(1) (ඔවුහු / ඔවුන්) ගී ගයනවා මා අසා නැත.

(2) ''අපි වැඩ (කරති / කරමු)'' යි සේවකයෝ පැවසූ හ.

(3) පව් (කරන්නන් / කරන්නෝ) නිරයට යා යුත්තෝ ය.

(4) විශාරදයෝ භාෂා (රීතීහු / රීතීන්) හඳුනා ගනිති.

(5) බහුශ්‍රැතයෝ ඇසූ පිරූ තැන් (ඇත්තෝ / ඇත්තන්) වෙති.

(ලකුණු 05)

(05 × 03 = 15)

(05) (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථය විග්‍රහ** කර ලියන්න.

(1) තම බිරිඳගේ රෝගය සුව කිරීමට නම් **ග්‍රහ ශාන්තියක්** කළ යුතු ම බව මුහන්දිරම් සිතුවේ ය.

(2) **නිරුදක** කතරක වුව ශක්තිමත් ව ගමන් කිරීමට ඔටුවා හට හැකි ය.

(3) මහලු යුවළ **ප්‍රවාසය** කළ කාලය තුළ ඔවුන්ගේ දේපොළ සියල්ල විනාශ විය.

(ලකුණු 03)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු **තනිපද ලියන්න.**

(1) ඔටුනු පැළඳවීමේ උත්සවය

(2) රාත්‍රියෙහි අන්තිම යාමය හෙවත් දසපැය

(3) බාධා නැති (ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය** වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(1) සුරඟන රැඟුමෙහි ................................................................. දුටු කවරෙක් සක් සැපක් පතත් ද?

(2) ශිෂ්‍යයා සෑම වසරක ම ................................................................. තරගයෙන් ජය ලබයි.

(3) සත් මහල් ................................................................. මුදුනේ බැබළුණු කොත් අග මිණි දිළුණි.

(4) සේවකයන් හට වාර්ෂික ව ලබාදෙන ................................................. දීමනා මෙවර ද බෙදා දුනි.

(5) ඒ රජුගේ ................................................................. තව තවත් වර්ධනය වූවා මිස අඩු නොවී ය.

(6) සැකකරු විසින් ................................... සියලු සිදුවීම් වර්තා හා ලිඛිත ලේඛන සියල්ල පොලිස් භාරයට ගැනිණි.

( ඓශ්වර්යය / ප්‍රාසාද / කථිත / ආශ්චර්යය / කථික / ප්‍රසාද ) (ලකුණු 03)

(ඊ) **තද කළු අකුරින් දක්වා ඇති <u>බහු අර්ථ පද යොදා වෙනත් අරුතක් දෙන ලෙස</u> වාක්‍ය බැගින් තනන්න.**

(1) මේ **මස** අගදී ප්‍රතිඵල නිකුත් වේ.

(2) දරුවා **වදන** අවස්ථාවෙහි දී පටාචාරාවෝ දුකින් පීඩිත ව ගියෝ ය.

(3) මිහි තල **මත** උපත ලද අප අයත් වන්නේ ද අවසන මිහිතලයට ම ය.

(4) මහ **නා** හිමියෝ එදින දනට වැඩම කළහ.

(5) මුවාත් තබන යකඩයක **මල** ඉගිලෙන්නාසේ පටාචාරාගේ ශෝක දුක තුනී විය.

(6) සත් **සර** නංවන ගී රස මධුර විය. (ලකුණු 06)

(ලකුණු 3 + 3 + 3 + 6 = 15)

(06) **තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න.**

(1) **දඩයම්කරු** වනයේ **මංමුළා** වූයේ ය.

(2) **සිසිලස** දෙන ගස්වැල් **නිසා** දාහය නිවේ.

(3) **කඩිරුළු අතන මෙතන විසිරෙමින්** සිට ගුළට රිංගුවෝ ය.

(4) **ඉපැරණි** ගී රසයෙන් **ජනතාව ප්‍රීතිමත්** වෙති.

(5) **වනෝද්‍යානය** පුරා **සුපිපි** මල් අනවසරයෙන් **කැඩුවොත්** දඩ මුදල් අය කෙරේ.

(ලකුණු 3 × 5 = 15)

(07) (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(1) සුදුසු වේලාවට ක්‍රියාත්මක වීම.

(2) සත් පුරුෂයන් අතර අසත්පුරුෂයෝ ද ගැවසීම.

(3) අනාගතයේ සිදුවිය හැකි දේ වර්තමානයේ සිට ම සැලසුම් කිරීම.

(4) අමතක නොවන යමක්.

(5) සෑම රීතියකට ම ව්‍යතිරේකයකුත් ඇත.

(6) අම්හිරි දෙයෙහිත් මිහිර ඇත. (ලකුණු 03)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි** වනසේ වාක්‍යවල යොදන්න.

(1) අගින් කිරි දෙවීම (4) අමු කැවිලා

(2) ඉහේ මලක් පිපීම (5) අං මතුවීම

(3) කබරගොයාට තැළීම (6) කුඩම්මාගේ ආදරය (ලකුණු 03)

(ඉ) පහත දී ඇති එක් එක් **යුගල පද සෑදී ඇති රටාව** කුමක්දැයි දක්වන්න.

(1) සමිති සමාගම් (4) හෝන්දු මාන්දු

(2) ගනු දෙනු (5) කා බී

(ඊ) පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා **පොදු භාවිතයේ යෙදෙන** පද ලියා දක්වන්න.

(1) අටංපහුර (4) අකනස් වීම

(2) වෙට්ටුල් ගෑහෙනවා (5) හාන්දුරුවො

(3) දීපංකරේ (6) උතුගොබළු (ලකුණු 03)

(උ) පහත දී ඇති **ප්‍රාස්තවික ව්‍යවහාරයන්ට** දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අර්ථ ලියන්න.

(1) වළාලය (4) අට හොඳයි

(2) රුකුල් පොජ්ජ (5) කිවුල් ඇළ

(3) අතමලු (6) හේලංගාව (ලකුණු 03)

(03 × 05 = 15)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවවිදේශීයආධිපත්‍යයටඅසුවීමටපෙරමුළුරටේමඅධ්‍යාපනයපැවතියේඒඒගම්වලපැවතිපන්සල්විසිනි
පන්සල්මගින්මූලිකඅධ්‍යාපනයක්ලැබීමෙන්පසුඋසස්අධ්‍යාපනයක්ලබාදීමසඳහාහැමපෙදෙසකමගම්කීප
යකටඑකපිරිවෙනක්බැගින්පිහිටුවාතිබුණේය.කෝට්ටේහෙවත්ජයවර්ධනපුරසමයවනවිටලංකාවේපැවති
ඉතාඋසස්පිරිවෙන්සංඛ්‍යාවක්ගැනලංකාඉතිහාසයෙහිසඳහන්වෙයිඑහෙත්පහතරටපරංගීන්සතුවීමෙන්ෙ
ම්පිරිවෙන්සියල්ලඅභාවයටපත්වූබවසැලකියහැකියඕලන්දසමයේපන්සල්අධ්‍යාපනයටහාපිරිවෙන්අධ්‍යා
පනයටකිසිමරුකුලක්නොලැබුණේයඑහෙත්භික්ෂූන්වහන්සේගේත්බෞද්ධමහාජනයාගේත්උනන්දුවනිසා
ආරම්භකරනලදපිරිවෙන්කීපයකටයටත්විජිතආණ්ඩුවවිසින්ආධාරදීමටපටන්ගන්නාලදී.ස්වර්ණතිලකපිරි
වෙනඉන්එක්පිරිවෙනකැයිසැලකේ.

(1) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න. (ලකුණු 07)

(2) ඝෝෂ අල්පප්‍රාණ සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 02)

(3) ඡේදයේ ඇති 'ආධිපත්‍යය' යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න. (ලකුණු 02)

(4) රේඵය හා රකාරාංශය යන දෙක ම අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න. (ලකුණු 02)

(5) ඉහත ඡේදයෙහි සඳහන් වන පදයක් බැඳි අකුරක් හා රේඵයක් සහිත ව නැවත ලියන්න. (ලකුණු 02)

(ලකුණු 15 යි.)